**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**<u>කොළඹ</u>**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ඉන්දීය ජාතිකයන් රැගත් හයවන විශේෂ ගුවන් යානය කොළඹ සිට ඉන්දියාව බලා පිටත් වේ</u>**

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සිරව සිටි ඉන්දියානු ජාතිකයන් 170 දෙනෙකු රැගත් එයා ඉන්ඩියා සමාගමේ විශේෂ ගුවන් යානයක් (AI 0282) 2020 ජූලි මස 18 වන දින කොළඹ සිට දිල්ලි වෙත පිටත් විය. **ලොව පුරා විවිධ රටවල සිරව සිටින ඉන්දියානුවන් නැවතත් සිය රටට ගෙන්වා ගැනීම සඳහා ඉන්දියාව විසින් මෙතෙක් ක්‍රියාත්මක කර ඇති විශාලතම වැඩසටහන වන 'වන්දේ භාරත්' මෙහෙයුමේ සිව්වන අදියර යටතේ මෙම ගුවන් යානය සූදානම් කර තිබිණ. වැඩ බලන ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මැතිතුමා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේදී මෙම ඉන්දීය ජාතික මගීන් හමු වූ අතර ඔවුන්ට සුරක්ෂිත ගුවන් ගමනක් ප්‍රාර්ථනා කළේය.**

**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි වීම් මත පදනම්ව මෙම ගුවන් යානය සඳහා මගී ලේඛනයක් සකස් කර ඇත. මේ සඳහා සේවයෙන් ඉවත් කරන ලද සංක්‍රමණික ශ්‍රමිකයන්/කම්කරුවන්, කෙටි කාලීන වීසා බලපත්‍ර කල් ඉකුත් වූ අයවලුන්, හදිසි වෛද්‍ය අවශ්‍යතා ඇති අයවලුන්, ගර්භණී මව්වරුන්/ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, පවුලේ සාමාජිකයකුගේ අවමංගල්‍යයක් සඳහා ඉන්දියාවට යාමට අවශ්‍ය කරන අයවලුන් සහ ඉන්දීය රජයේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද විදෙස් රටවල සිරව සිටින ඉන්දියානු ජාතිකයන් සිය රටට ගෙන්වා ගැනීමේ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියේ දැක්වෙන පරිදි ශිෂ්‍යයන් ඇතුළු අත්‍යාවශ්‍ය අයවලුන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.**

**කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ජාත්‍යන්තර සංචාර මත පැනවී තිබෙන සීමා නිසා ශ්‍රී ලංකාවේ සිරව සිටි ඉන්දීය ජාතිකයෝ නැවතත් තම රට වෙත යාමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් සිය සතුට ප්‍රකාශ කළෝය. මේ වන විට ශ්‍රී ලංකාවේ සිරව සිටි ඉන්දීය ජාතිකයන් 1800 කට අධික පිරිසක් මෙම ගුවන් යානය, 2020 මැයි මස 29, ජූනි 15, ජූනි 22, ජූලි 03 හා ජූලි 08 යන දිනවල පිටත් වූ විශේෂ එයා ඉන්ඩියා ගුවන් යානා, ජූනි 1 වන දින කොළඹ සිට ටුටිකොරින් වෙත පිටත් වූ ඉන්දීය නාවික හමුදාවේ ජලශ්වා නෞකාව සහ විවිධ විශේෂිත ගුවන් යානා මගින් එරටට රැගෙන ගොස් ඇත.**

**මේ වන තෙක් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි වී නැති ඉන්දීය ජාතිකයන්ට පහත ලින්ක් එක මගින් ලියාපදිංචි විය හැකිය. https://hcicolombo.gov.in/COVID_helpline ශ්‍රී ලංකාවේ සිරව සිටින ඉන්දීය ජාතිකයන්ට ඉවසීම් සහගතව සිටිනා ලෙස සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ නිල වෙබ් අඩවියේ සහ සමාජ මාධ්‍යයන්හි යාවත්කාලීන කිරීම් පිළිබඳව අවධානයෙන් සිටින ලෙස උපදෙස් දෙනු ලැබේ.**

****

කොළඹ

ශක වර්ෂ 1942 අශාද 29

2020 ජූලි 20